# වන අසිරිය



රැහංසා පින්සරණි ගුණරත්න

# වන අසිරිය

රුහංසා පින්සරණි ගුණරත්න

**වන අසිරිය -**

කතා ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2026


කතාව සහ චිත්‍ර

**රුහංසා පින්සරණි ගුණරත්න**

4 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර



ISBN 978 624 211 137- 7

# පිදුම

මහාමායා මව්
සෙවණේ සිට
දෙවැනි වරටත්
පොතක් අකුරු කිරීමට
ලැබීම
ඉමහත් සතුටකි
ඒ මා ලද
ඉතා වටිනා අවස්ථාවක්
ලබා දුන්
මාගේ ගුරු මව්පියන්ට
උපහාර පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# ආණ්ඩුකාරතුමාගේ සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# දියවඩන නිලමේතුමාගේ සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව,
2026.05.10



ලස්සන වනාන්තරයක් තිබුණා. වනය අසිරීමත් වෙන්නේ ගස්වැල් නිසාය. අපිට ප්‍රයෝජනවත් වෙන ගස්වැල් බොහොමයක් ඇත. ඒ ගස් වැල් වලින් අපට ආහාර, ඖෂධ බොහොමයක් තිබේ.



තවද මිනිසාට ගෙදොර උපකරණ සෑදීමට දොර ජනෙල්සෑදීමට ගස් වැල් ප්‍රයෝජනවත් වේ. මෙම සෑම ප්‍රයෝජනයක් සඳහාම මිනිසා අසිරිමත් වනය විනාශ කර දමයි.

සැමදාමත් අපි වනය විනාශ නොකර ආරක්ෂා කර ගනිමු. එවිට සැමදා අපට අසිරිමත් වනය දැක ගන්නට හැක.



වනය සිටින සතුන් නිසා වනය තවත් සුන්දර වේ. වනයේ සැර සතුන් අහිංසක සතුන් බොහෝ දෙනෙක් ඇත.

කුරුල්ලන්ගේ මිහිරි ගීත නාද නිසා පරිසරයේ අසිරිය තවත් වැඩිවේ. අපා දෙපා සිව්පා වැනි සත්තු නිසා පරිසරය තවත් අලංකාර වේ.

කුරුල්ලන්ගෙන් අලංකාර කූඩු
හදන කුරුල්ලන් ද ඇත.
කුරුල්ලන්ගේ අලංකාර
නිවහන නිසා වනයේ අසිරිය
තවත් වැඩිවේ.





අලංකාර කූඩු හදන
කුරුල්ලෙක් නම් වඩු
කුරුල්ලාය. ගස් බෙනවල
ජීවත් වෙන සත්තු ද ඇත.
අලංකාරවත් ලෙස විශාල
ගස්වල බෙන සාදා ජීවත්
වෙන සත්තු ද සිටි.

බෙනවල ජීවත් වන සත්තු නම්
ගිරවා, මයිනා, කෑරලා,
කොට්ටෝරුවා, බකමූණා.



තවද වනයේ ගුහාවල, ගල්වල ජීවත්වන සතුන් ද ඇත. තවද වනයේ සිටින විශාල සතුන් කොටි, වලස්සු, සිංහයෝ කුඩා සතුන්ව ආහාරයට ගනි.

වනයේ විෂ සතුන්ද ඇත. සර්පයන් වැනි කහ ගැරඬියා, කළු ගැරඬියා, තෙල් කරවලා, ඇහැටුල්ලා, නයි, පොළොන්ගු ඒවැනි සතුන්ගේ නිවහන වනය.



වනය අසිරීමත් වන්නේ මේ සතුන් නිසාය.


රාත්‍රී කාලයට වනය අසිරීමත් කරන්නේ බකමූණා, වවුලා, කණාමැදිරියන් ය. කණාමැදිරියන්ගේ ආලෝකය නිසා රාත්‍රී කාලයට වනය වර්ණවත් වේ. මේ හැම දෙයක් නිසාම වනයේ අසිරීය තවත් වැඩි වේ.



වනයේ ලස්සන ලස්සන මල් බොහොමයක් ඇත. සමනල්ලු ඒ මල්පැණි උරා බොනවා. මේ හැම දෙයක් නිසාම වනය කොයි තරම් ලස්සන ද?



වනයේ අසිරිය තවත් වැඩි කරන්න පුංචි දිය ඇලි සහ ගංගා තියෙන්න ඕන. මිනිසා වනය බලන්න එන විට පුංචි දිය ඇලි වලට  තවත් ලස්සන ගංගා වලට කුණු දානවා. එහෙම කරන් නැතුව පුංචි ගංගා, දිය ඇලි ආරක්ෂා කර ගනිමු. මිනිසා ඇළට, ගඟට කුණු දාද්දී පොඩි මාළු මැරෙනවා.



ගංගා ඇල දොළ ලස්සන
වන්නේ ඒවයේ ජීවත් වන
මාළුන් සහ ජලයේ ජීවත් වන
අනෙකුත් සත්තු නිසයි.



ගංඟා ඇළ ,දොළ
ගස්වැල් සත්තු එකතු
වෙලයි වනය නිර්මාණය
වන්නේ. අපි සැමදා මේ
වනය සුරකිමු.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)